# "ආරෝග්‍යා" වැඩිහිටි මූල්‍යාධාර වැඩසටහන - 2024

## 01. හැඳින්වීම

දිවයින පුරා ජීවත්වන, විවිධ බෝනොවන රෝගාබාධයන්ගෙන් පෙළෙන වැඩිහිටියන්ගේ මූල්‍ය දුෂ්කරතා අවම කිරීම වෙනුවෙන් යම් සහනයක් සැලසීම අරමුණු කරගනිමින් අවුරුදු 60 සම්පූර්ණ වූ, **පිළිකා රෝගය, වකුගඩු ආශ්‍රිත රෝග, හෘද රෝග, ස්නායු රෝග, පෙනහළු ආශ්‍රිත රෝග, අක්මාව අන්ත්‍රය ආශ්‍රිත රෝග, පූර්ණ අන්ධභාවය, පේෂි හා හන්දි රෝග හා අංශභාගය යන රෝගී** තත්ත්වයන්ගෙන් පෙළෙන, **අඩු ආදායම්ලාභී** වැඩිහිටියන් වෙත ආධාර ලබාදීම මෙම වැඩසටහන මගින් සිදුකරනු ලැබේ. රෝගී තත්ත්වයන් අනුව ප්‍රතිකාර වෙනුවෙන් රෝහල් කරා යාමේදී අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සලසා ගැනීම, මිල අධික ඖෂධ වර්ග මිලදී ගැනීම, ඖෂධීය ආහාර වර්ග මිලදී ගැනීම, වෛද්‍ය පරීක්ෂණ සිදුකිරීම, විවිධ ප්‍රතිකාර ක්‍රියාවලින් වලදී, (රුධිර කාන්දුකරණය වැනි) වන වියදම් පියවා ගැනීම ආදී කාර්යයන් සඳහා මෙම ආධාර මුදල් යොදාගත හැකිය. 2024 වර්ෂය සඳහා ප්‍රතිලාභීන් 2000 දෙනෙකු සඳහා රු. 25,000.00 බැගින්, සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආවරණය වන පරිදි මුදල් ආධාර ලබාදීමට නියමිතය. 2024 වර්ෂය සඳහා අගෝස්තු 31 දින දක්වා ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට හැකියාව ඇත.

## 02. ආධාර ලබාදීමට අපේක්ෂා කෙරෙන රෝගී තත්ත්වයන්

| | |
|---|---|
| ❖ පිළිකා රෝගය | නිර්දේශිත ප්‍රතිකාර ලබාගනිමින් සිටී නම් පමණක් |
| ❖ වකුගඩු ආශ්‍රිත රෝග | වකුගඩු බද්ධ කිරීමට නිර්දේශිත, කාන්දුකරණය සිදුකරන්නේ නම් හෝ නිදන්ගත වකුගඩු රෝග නිසා එදිනෙදා කටයුතු සඳහා පූර්ණ වශයෙන් අන් අය මත යැපෙන වැඩිහිටි පුද්ගලයන් සඳහා පමණක් |
| ❖ හෘද රෝග | හෘද සැත්කම්, ස්ටෙන්ට් දැමීම වැනි ප්‍රතිකාර සඳහා නිර්දේශ කර හෝ එවැනි සැත්කම් සිදුකර, දීර්ඝකාලීනව ප්‍රතිකාර ලබාගන්නේ නම් හෝ හෘද රෝග නිසා එදිනෙදා කටයුතු සඳහා අන් අය මත යැපෙන වැඩිහිටි පුද්ගලයන් සඳහා පමණක් |
| ❖ ස්නායු රෝග | නිදන්ගත ස්නායු රෝග වන ආඝාතය, පාකින්සන් හෝ ඩිමෙන්ෂියා රෝග තත්ත්වයන් නිසා හෝ අනතුරු නිසා මොලයට හෝ සුසුම්නාවට හානි වීමෙන් ඇඳගතව තමන්ගේ කාර්යයන් ස්වාධීනව කරගැනීමට නොහැකිව සිටී නම් පමණක් |
| ❖ පෙනහළු ආශ්‍රිත රෝග | නිදන්ගත පෙනහළු ආශ්‍රිත රෝගවලින් පෙළෙන ස්වසන අපහසුතා හේතුවෙන් දෛනික කාර්යයන් ඉටුකර ගැනීමට නොහැකි අන්අය මත යැපෙන හෝ දීර්ඝකාලීනව ගෘහස්ත ඔක්ෂිජන් භාවිතය විශේෂඥ වෛද්‍යවරයෙක් විසින් නිර්දේශ කරන ලද වැඩිහිටියන් සඳහා පමණක් |
| ❖ අක්මාව අන්ත්‍රය ආශ්‍රිත රෝග | එදිනෙදා කටයුතු වලදී අන්අය මත යැපෙමින් නිර්දේශිත ප්‍රතිකාර ලබමින් නිදන්ගත අක්මා අගන්‍යාස හෝ ආන්ත්‍රික රෝගවලින් පෙළෙන වැඩිහිටියන් පමණක් |
| ❖ පූර්ණ අන්ධභාවය | පූර්ණ වශයෙන් අන්ධ භාවය සමග ශරීර දුර්වලතා නිසා එදිනෙදා කටයුතු සඳහා අන්අය මත යැපෙන වැඩිහිටියන් සඳහා පමණක් |

❖ පේෂි හා හන්දි රෝග — නිදන්ගත බහුවිධ හන්දි රෝගවලින් පෙලෙන බවට රෝග විනිශ්චයක් ඇති තමන්ගේ එදිනෙදා කටයුතු වලදී පූර්ණ වශයෙන් අන්අය මත යැපෙන වැඩිහිටියන් පමණක්

❖ අංශභාගය — ඇඳගත හෝ තමන්ගේ කාර්යයන් සිදුකර ගැනීමට නොහැකි තත්ත්වයේ සිටී නම් පමණක්

➢ **ඉහත සඳහන් රෝගී වැඩිහිටියන් සඳහා පමණක් ආධාර ලබාදීමට කටයුතු කරනු ලැබේ.**

## 03. <u>ප්‍රතිලාභීන් තෝරා ගැනීම</u>

❖ වයස අවුරුදු 60 සම්පූර්ණ කරන ලද, අඩු ආදායම්ලාභී වැඩිහිටියන් සඳහා ඉල්ලුම් කිරීමට හැකියාව ඇත.

❖ එක් පවුලකින් එක් වැඩිහිටියෙකු සඳහා පමණක් ආධාර මුදල් සඳහා ඉල්ලීම් කිරීමට හිමිකම් ඇත.

❖ එක් වැඩිහිටියෙකු වෙනුවෙන් එක්වරක් පමණක් ආධාර මුදල් ලබාදීමට කටයුතු කළ යුතුය.

❖ රාජ්‍ය හෝ වෙනත් ආයතන වලින් වකුගඩු රෝගය හෝ මෙහි සඳහන් රෝග සඳහා **රු. 2,000.00 ට වැඩි** මාසික ආධාර ලබන වැඩිහිටියන්හට මෙම ආධාර ලබාගැනීම සඳහා ඉල්ලීම් කළ නොහැකිය.

❖ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් ලබාදෙනු ලබන රු. 2,000.00 ජීවනාධාර දීමනාව හා අවුරුදු 100 ට වැඩි වැඩිහිටියන් වෙත ලබාදෙන රු. 5,000.00 දීමනාව ලබන වැඩිහිටියන් සඳහා ද මෙම ආධාර මුදල සඳහා ඉල්ලීම් කළ හැකිය.

## 04. <u>ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම</u>

❖ නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය මගින් වැඩිහිටියන් සම්බන්ධ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබාගත යුතුය.

❖ සෑම ඉල්ලුම්කරුවෙකුම තමා පසුවන රෝගී තත්ත්වයට ප්‍රතිකාර ලබාගන්නා සායනික වෛද්‍ය වාර්ථාවේ සහතික කරන ලද පිටපතක් අමුණා තිබිය යුතුය.

❖ මෙම ආධාර මුදල ලබාදීමට අයදුම්කරු සුදුස්සකු බවට රජයේ ලියාපදිංචි වෛද්‍යවරයෙකු විසින් අයදුම්පත්‍රයෙහි සඳහන් පරිදි නිර්දේශකළ යුතුය.

❖ අදාල අයදුම්පත් ග්‍රාම නිලධාරි විසින්, පදිංචිය හා අඩු ආදායම්ලාභී බව සහතික කළයුතු අතර, වැඩිහිටි විෂය සම්බන්ධ නිලධාරි විසින් ආධාර මුදල ලබාදීම සුදුසු බව සහතික කළයුතුය.

❖ අදාල අයදුම්පත්, සහකාර ප්‍රාදේශීය ලේකම් විසින් නිර්දේශකර, ප්‍රාදේශීය ලේකම් විසින් අනුමතකර තිබිය යුතුය.

## 05. <u>ක්‍රියාත්මක ක්‍රමවේදය</u>

❖ ඉල්ලීම් කිරීමේදී, මේ සමග ඇති ඇමුණුම 02 ආකෘතිය මගින්, අදාල සියලු තොරතුරු ඇතුලත් කොට, ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව, නියමිත පරිදි ඉල්ලීම් කළ යුතුය. (මෙහිදී, අදාල ඉල්ලුම්පත්, ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය නොවේ)

- එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින් වැඩිහිටියන් දසදෙනෙකු (10) දක්වා මූලික වශයෙන් ආධාර ඉල්ලීම් කළහැකිය. එම ප්‍රමාණයට වඩා වැඩි පිරිසක් සඳහා ඉල්ලීම් ඉදිරිපත් කරන්නේ නම්, නාම ලේඛනයේ ප්‍රමුඛතාවයේ අනුපිළිවෙලට ඉදිරිපත් කළයුතු අතර, එම ඉල්ලීම් සඳහා වර්ෂය අවසානයේදී, ඉතිරිවන ප්‍රතිපාදන ප්‍රමාණය අනුව, ආධාර ලබාදීමට කටයුතු කරනු ලැබේ.

- මෙම ආධාර මුදල් අදාල ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ලබාදීමට නියමිත අතර, ආධාර හිමි ප්‍රතිලාභීන් වෙත එම මුදල් කඩිනමින් ලබාදීමට කටයුතු කළ යුතුය.

- යම් හේතුවකින් ප්‍රතිලාභියෙකු වෙත ආධාර ලබාදීමට නොහැකි වන්නේ නම්, (මියයාම, පදිංචිය හැර යාම හෝ වෙනත් නොවැලැක්විය හැකි හේතුවක් මත) එම මුදල, කොට්ඨාශයේ සුදුසුකම් ලත් වෙනත් වැඩිහිටියෙකු වෙත ලබාදීමට හැකියාව ඇති ඇත. ඒ සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. එම අනුමැතිය ලබාගැනීමේදී ඉහත **ඇමුණුම 02** ආකෘතිය අනුව නව ප්‍රතිලාභියාගේ තොරතුරු ඉදිරිපත් කළයුතු වේ. එසේ නොමැති නම්, මේ වන විටත් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ඉල්ලීම් ඉදිරිපත් කරන ලද එහෙත් ආධාර ලබාදී නොමැති ප්‍රතිලාභියෙකු ඇත්නම් එම ප්‍රතිලාභියා සඳහා අදාල අනුමැතිය ලබාගත හැකිය.

- එමෙන්ම ආධාර වෙනුවෙන් යවනලද මුදලක් නැවත එවන්නේ නම්, වැඩිහිටියන්ගේ සුබසාධනය සඳහා වන ජාතික අරමුදල (NATIONAL FUND FOR THE WELFARE OF ELDERS -228075) නමින් ලියන ලද චෙක්පතක් මගින් යොමුකල හැකි අතර, අදාල ගිණුමට තැන්පත් කිරීමට හැකියාව ඇත.

06. <u>පසුවිපරම් සිදුකිරීම</u>

- ආධාර මුදල් ලබාදීම සම්බන්ධ පසු විපරම් කටයුතු විෂය සම්බන්ධ නිලධාරීන්ගේ සම්බන්ධීකරණයෙන් යුතුව ප්‍රාදේශීය ලේකම් වරුන් විසින් සිදුකළ යුතුය.

- චෙක්පතට අදාල කුවිතාන්සිය (චෙක්පතට අදාල ලදුපත) හා වැඩිහිටියන් වෙත ආධාර මුදල් ලබාදීම සම්බන්ධ වාර්තාව ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත නොපමාව ඉදිරිපත් කළ යුතුය.

කේ.ජී. ලැනරෝල්
අධ්‍යක්ෂ